2nd International Conference of Multidisciplinary Approaches (iCMA), 2015
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka

ISSN: 2386 – 1509
Copyright © iCMA


# සිංහල බෞද්ධ ජනසමාජගත පුද්ග කායික හා මානසික සදාචාර පරිහානිය විසයෙහි අන්තර්ජාලයේ බලපෑම පිළිබඳ විමර්ශනයක්

සංඛපාලේ පඤ්ඤාසාර හිමි
sankhapala1984@gmail.com

භෞතික දියුණුවේ උච්ච අවස්ථාවට පාතබා ඇති නූතන මිනිසා සිය සන්නිවේදන අවශ්‍යතාව වෙනුවෙන් සකසා ගත් දියුණු තාක්ෂණික මෙවලම අන්තර්ජාලයයි. මිනිසාගේ විවිධ සන්නිවේදන කාර්යයන් පහසුවෙන් හා ක්‍රමවත් ලෙස සිදුකරගැනීමේ අවශ්‍යතාව වෙනුවෙන් අන්තර්ජාලය විශාල කාර්යභාරයක් සිදුකරයි. නමුත් එය නූතනය වනවිට අන්තර්ජාල නිර්මාපකයන් අපේක්ෂාකළ අරමුණුද ඉක්මවා ගිය ඉතා සංකීර්ණ බහුකාර්ය සන්නිවේදන මාධ්‍යයක් බවට එය පත්ව ඇත. ගෝලීයකරණ ක්‍රියාවලියේ විශාල කාර්යභාරයක් ඉටුකරනුලබන අන්තර්ජාලය ශ්‍රී ලංකාවේ සන්නිවෙදන ජාලයට ද සක්‍රීයව දායක වෙයි. මෙරට ජනතාව ස්වකීය ජීවිතයේ සාමාන්‍ය ජීවන ප්‍රතිපදාවන්පවා අන්තර්ජාලයට අනුගතව සකසාගෙන ඇතිබව පැවසීම අතිශයෝක්තියක් නොවේ. රැකියාව, නින්දට යාම, නින්දෙන් පිබිදීම, ආහාර අනුභවය ආදී සෑම කාර්යයක්ම අන්තර්ජාලීය බලපෑම යටතේ හැඩගස්වා ගැනීමට මෙරට ජනතාව ක්‍රියා කරමින් සිටිති. පොදු ජනමාධ්‍ය විශාල පිරිසක් ඉලක්කකොට ගෙන හැසිරුන ද අන්තර්ජාලය පෞද්ගලිකව එක් එක් පුද්ගල අවශ්‍යතාව මත හැසිරෙයි. එසේ වුවත් පොදු ජනමාධ්‍යයෙන් පුද්ගලයාට කෙරෙන බලපෑමට වඩා විශාල බලපෑමක් පෞද්ගලිකව අන්තර්ජාලයෙන් සිදුකරයි.

බෞද්ධ සදාචාර ධර්මවල ආභාසයෙන් ගොඩනැගුණු මෙරට බෞද්ධ ජනසමාජයේ පුද්ගල සදාචාරය කෙරෙහි නූතනයේ ඍජුව හා වක්‍රව අන්තර්ජාලය විශාල බලපෑමක් එල්ලකරමින් සිටියි. කායික හා මානසික වශයෙන් පුද්ගල සදාචාරය වර්ග කළ හැකි අතර මෙම දෙඅංශයේ ම සදාචාර පරිහානිය කෙරෙහි අන්තර්ජාලයේ බලපෑම එල්ලවී තිබේ. අන්තර්ජාලයේ අන්තර්ගත විවිධ සදාචාර විරෝධී වෙබ් අඩවි, ක්‍රියාකාරකම් හරහා පුද්ග මනස තුළ අයහපත් සිතිවිලි (ක්‍රෝධය, අධික කාමුක බව, ඊර්ෂ්‍යාව, මානය, හිංසාවාදී සිතිවිලි) නිර්මාණය වීම, කායික වශයෙන් විවිධ සදාචාර විරෝධී ක්‍රියාවන්ට යොමුවීම (ප්‍රාණඝාතය, සොරකම, අයතා ලිංගික ක්‍රියා, අසාමාන්‍ය ලිංගික ක්‍රියා, සුරාව සූදුව) ආදිය හරහා පුද්ගල කායික හා මානසික සදාචාරය පිරිහී ඇත. අන්තර්ජාල ඇබ්බැහිවීම හේතුවෙන් කායික රෝග රැසකට ද (ඉරුවාරදය, අක්ෂි රෝග, කොඳුඇටපෙළ ආශ්‍රිත රෝග, ස්ථූලභාවය, ලිංගික බෙලහීනතා, පරපීඩක කාමය) මානසික රෝග රැසකට ද (විශාදය, කාංසාව, නිද්‍රාමය ගැටලු, සමාජ හීතිකාව, පෞරුෂ ගැටලු) පුද්ගලයා ගොදුරුවී ඇත. සදාචාරවත් සමාජයක් නිර්මාණය වීම සඳහා කායික හා මානසික නිරෝගිබව අත්‍යවශ්‍ය සාධකයක් වන අතර එය පිරිහීයාම සමාජ සදාචාර පරිහානිය කෙරෙහි විශාල පිටුබලයකි. අන්තර්ජාලය හරහා කෙරන පුද්ගල කායික හා මානසික බලපෑමත් එමගින් ඇතිවන සදාචාර පරිහානිය පිළිබඳවත් අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය හරහා සිදුවිය.

ප්‍රමුඛ පද - අන්තර්ජාලය, සදාචාර පරිහානිය, සන්නිවේදන මාධ්‍යය, සිංහල බෞද්ධ සමාජය, කායික හා මානසික සදාචාරය